# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1585/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 17/12/2023<br>පැය 0540 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - අලව්ව පොලිස් වසම.**

2023.12.16 වන දින සවස් කාලයේ අලව්ව පොලිස් වසමේ මාබෝපිටිය ප්‍රදේශයේදී නිවසක් තුළ තියුණු ආයුධයකින් පහරදී කාන්තාවක් ඝාතනය කර ඇති බවට අලව්ව පොලිස් ස්ථානයට ලද තොරතුරක් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 77 ක් වූ මාබෝපිටිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ඝාතනය සිදුකල සැකකරු මරණකාරියගේ බාල පුතා වන අතර ඔහු බීමත්ව පැමිණ තම මව සමඟ බහින්බස් වීමක් ඇතිකර ගැනීමෙන් අනතුරුව මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරනය වී ඇත. සිද්ධියෙන් පසු සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර මහෙස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ මරීක්ෂණය සඳහා මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. අලව්ව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.**

2023.12.16 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ නව කැලණි පාලම අසල ප්‍රදේශයේදී පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ සේදවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඝාතනය සිදුකල සැකකරුවන් විසින් මරණකරුගෙන් ඔහුගේ ජංගම දුරකථනය ඉල්ලා සිටීමෙදී ඇති වූ බහින්බස්වීමක් මත තියුණු ආයුධයකින් පහරදී මෙම

ඝාතනය සිදුකර ඇති අතර එම ඝාතනය සම්බන්දයෙන් සැකකරුවන් දෙදෙනෙකු ග්‍රෑන්ඩ්පාස් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 18 ක් වන කොළඹ 14 හා වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 03. සැකකටයුතු මරණයක් - කුරුදුවත්ත පොලිස් වසම.

2023.12.15 වන දින රාත්‍රී කාලයේදී කුරුදුවත්ත පොලිස් වසමේ විජේරාම ප්‍රදේශයේ නිවසක තනිව ජීවත්වූ කාන්තාවක් නිවසේ මුළුතැන්ගේ අසල වැටී සිටින බවට ලද තොරතුරක් මත කුරුදුවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් 1990 සුවසැරිය ගිලන්රථය ගෙන්වා කාන්තාව පරීක්ෂාකරවා ඇති අතර එහිදී මෙම කාන්තාව මිය ගොස් ඇති බවට දන්වා ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වූ විජේරාම මාවත, කොළඹ 07 ලිපිනයේ පදිංචිකාරියෙකි.**

මෙම මරණයට හේතුව මෙතෙක් අනාවරණය වි නොමැති අතර මෘත ශරීරය සම්බන්ධ මහෙස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය කොළඹ ජාතික රොහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුරුදුවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දියේ ගිලෙමින් සිටි පුද්ගලයෙකු බේරා ගැනීමක් - පානදුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2023.12.16 වන දින දහවල් කාලයේ පානදුර පොලිස් වසමේ පානදුර වෙරළ තීරයේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දිය වැලකට හසුවී දියඹට ඇදී යන අවස්ථාවේ දී එහි රාජකාරි යෙදි සිටි පානදුර පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් කොස්තාපල් 33628 ලක්මාල්, පොලිස් කොස්තාපල් 91046 දසුන් හා පොලිස් කොස්තාපල් 101557 ධනුක යන නිලධාරීන් විසින් ක්ෂණිකව ක්‍රියාත්මකවී එම පුද්ගලයා බේරාගෙන මුලික ප්‍රථමාධාර ලබා දී මුදාහැර ඇත.

**මෙසේ දියේ ගිලෙමින් සිටියදී බේරාගත් පුද්ගලයා වයස අවුරුදු 21 ක් වූ වේරවත්ත, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

## 05. වන අලියෙකු පහර දී කාන්තාවක් මිය යාමක්- අරනගංවිල පොලිස් වසම.

2023.12.16 වන දින සවස් කාලයේදී අරනගංවිල පොලිස් වසමේ යාය 08 ප්‍රදේශයේ නිවසක් පිටුපස කාන්තාවක් මිය ගොස් ඇති බවටත්, දේහයේ කොටස් සතුන් විසින් විනාශ කර ඇති බවටත් ලද තොරතුරක් මත අරනගංවිල පොලිස් ස්ථානයේ නිලධාරීන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වූ යාය 08, අරනගංවිල ලිපිනයේ පදිංචිකාරියෙකි.**

මරණකාරිය තනිවම නිවසේ පදිංචිව සිට ඇති අතර වන අලියෙකු පහරදීමකින් මෙම මරණය සිදු වී ඇති බවට දැනට සිදු කල විමර්ශන වලදී අනාවරණය වී ඇත. මහෙස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත

ශරීරය පොලොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අරනගංවිල පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2023.12.16 වන දින දහවල් කාලයේ දී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පැලියගොඩ පොලිස් වසමේ හතරේ කණුව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පානදුර උතුර පොලිස් ස්ථානය.

2023.12.16 වන දින දහවල් කාලයේ දී පානදුර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පානදුර උතුර පොලිස් වසමේ ගිම්පත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 240 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන කෙසෙල්වත්ත, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පානදුර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීටියාගොඩ පොලිස් ස්ථානය.

2023.12.16 වන දින උදෑසන කාලයේ දී මීටියාගොඩ ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මීටියාගොඩ පොලිස් වසම ලෙව්දුව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 950 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මීටියාගොඩ පදිංචිකරුවෙකි.**

මීටියාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 09. ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇහැටුවැව පොලිස් ස්ථානය.

2023.12.16 වන දින දහවල් කාලයේ දී ඇහැටුවැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඇහැටුවැව පොලිස් වසමේ මයිගලස්වැව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන දළුපතගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇහැටුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.**

2023.12.16 වන දින දහවල් කාලයේ තලංගම පොලිස් වසමේ පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දොරටුව අසලදී විභාග දෙපාර්තමේන්තුව ඇතුලත සිට පිටතට යාම සඳහා පැමිණි ලොරි රථයක් රියදුරට රථය පාලනය කර ගැනීමට නොහැකිව ප්‍රධාන දොරටුවේ ආරක්ෂක රාජකාරි යෙදි සිටි නිලධාරියෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ආරක්ෂක නිලධාරියා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටිය දී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ හොකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**11. මාරක රිය අනතුරක් - එරාවූර් පොලිස් වසම.**

2023.12.16 වන දින රාත්‍රි කාලයේ එරාවූර් පොලිස් වසමේ එරාවූර් මඩකලපුව මාර්ගයේ සවුකඩේ හන්දිය අසලදී මඩකලපුව දෙස සිට එරාවූර් දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකකයේකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා එරාවූර් රෝහලට ඇතුලත් කිරීමේ දී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු ක් 17 ක් වූ අයියන්කේනි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය එරාවූර් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**12. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.**

2023.12.16 වන දින රාත්‍රි කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ නිට්ටඹුව ඔරලෝසු කණුව අසලදී කොළඹ දෙස සිට නුවර දෙසට ධාවනය වූ බස් රථයක් බස්නැවතුම දෙසට ධාවනය කිරීම සඳහා දකුණු පැත්තට හරවන විට දී නුවර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරු පැදිය බස් රථයේ බඳ කොටසේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදයේ පැමිණි පසුපැදිකරු එම ස්ථානයේ දීම මිය ගොස් ඇති අතර බරපතල තුවාල ලැබූ පැදිකරු වතුපිටිවල රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 15 ක් වූ පොල්හේන, රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - කල්පිටිය පොලිස් වසම.**

2023.12.16 වන දින සවස් කාලයේ කල්පිටිය පොලිස් වසමේ කල්පිටිය පාලවිය මාර්ගයේ ඒත්තාලය ප්‍රදේශයේ දී කල්පිටිය දෙස සිට පාලවිල දෙසට ධාවනය වු යතුරු පැදියක් ඉදිරියෙන් එම දිසාවටම ධාවනය වු ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේ දි මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වු වට්ටච්චෝලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - හෝමාගම පොලිස් වසම.**

2023.12.16 වන දින රාත්‍රී කාලයේ හෝමාගම පොලිස් වසමේ කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ දී කොට්ටාව දෙස සිට හෝමාගම දෙසට ධාවනය වූ කුඩා ලොරි රථයක් පාර හරහා ගමන් කල පදිකයකයන් දෙදෙනෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයින් දෙදෙනා හෝමාගම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටිය දී එක් පදිකයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ බකමූණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**15. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.**

2023.12.16 වන දින උදෑසන කාලයේ තලංගම පොලිස් වසමේ කොල්ලුපිටිය කඩුවෙල මර්ගයේ බත්තරමුල්ල ප්‍රදේශයේදී කඩුවෙල දෙස සිට කොල්ලුපිටිය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගය හරහා ගමන්කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා තලංගම රෝහලට ඇතුලත් කිරීමේ දී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 79 ක් වූ බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තලංගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**